CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்
No. 6 1/B, Layards Road, Colombo 05. **Tel:** +94112584047 / +94114503001
**Fax:** +94112584047 **E-mail:** cmev@cpalanka.org **Web:** www.cmev.org


2022 මැයි 25 දින.

## රටෙහි පවත්නා වර්තමාන අර්බුධකාරී තත්වය පිළිබඳ CMEV මාධ්‍ය ප්‍රකාශය

රටෙහි ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍ය බිඳවැටීම කෙරෙහි CMEV සිය බලවත් කණස්සල්ල ප්‍රකාශකර සිටී. 2022 මැයි 09 දින රටේ බොහෝ ප්‍රදේශවල හටගත් දැඩි විනාශකාරී ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් පසුව පොලිස් පරීක්ෂණ හා සැකකරුවන් අත්අඩංගුවට ගැනීම දේශපාලන බලපෑම් මත සිදුවන බවට CMEV වෙත වාර්තාවී ඇත. ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ බවට පැහැදිලි සාක්ෂි නොමැතිව ඇතැම් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති බව CMEV වෙත වාර්තා වී ඇත. එවන් එක් සිදුවීමක් ලෙස මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවෙකු අත්අඩංගුවට ගැනීම දැක්විය හැකිය. එරාවුර් ප්‍රදේශයේ 16 හැවිරිදි පිරිමි දරුවකු වන මොහු ප්‍රදේශයේ රැස්වසිටි විශාල ජනකායකගේ ඡායාරූපයක සිටීම නිසා පමණක් අත්අඩංගුවට ගෙන ඇත. ඔහුට ඇප ලබා දී ඇත්තේ මැයි 23 දින සඳුදා පස්වරුවේදීය.

මයිනා ගෝ ගම සහ ගෝඨා ගෝ ගම ස්ථාන වලදී ප්‍රචණ්ඩත්වය දියත් කළ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් වීඩියෝ සහ වෙනත් සාක්ෂි තිබියදීත් ඔවුන් අත්අඩංගුවට ගැනීමට පොලිසිය දක්වන අකමැත්තද CMEV ය නිරීක්ෂණය කර ඇත. ගෝඨා ගෝ ගමට සිදුවූ ප්‍රහාරය සම්බන්ධයෙන් පැමිණිලි කර ඇති සහ එහි ඇසූ දුටු සාක්ෂිකරුවන් වන ජීවන්ත පීරිස් පියතුමා සහ තවත් බොහෝ දෙනෙකුගේ විදේශ ගමන් අත්හිටුවීමේ නියෝගයක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන ඇති බව CMEV ට වාර්තාවිය. ඔවුන් සියලු දෙනාම නිර්පාක්ෂික ජනතා අරගලයේ ක්‍රියාකාරී ආධාරකරුවන් වෙති.

සමාජයේ නීතිය, සාමය සහ නීතියේ ආධිපත්‍ය සහතික කිරීම සඳහා ස්වාධීනව සහ වගවීමෙන් කටයුතු කරන මෙන් CMEV සියලු නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලින් ඉල්ලා සිටී. පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාගේ 2021.12.06 දිනැති ලිපියට අනුව 2011.01.01 සිට 2021.11.03 දක්වා කාලය තුල පත්කළ පොලිස් ස්ථානාධිපතිවරු 184 දෙනාගෙන් 182 ක් ට එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් නොමැති බවට දැන ගැනීමෙන් CMEV මහත් කම්පනයට පත්විය. (එම ලිපිය අන්තර් ජාලයෙන් ලබාගත හැකිය). අදාල පොලිස් බල ප්‍රදේශවල ස්ථානාධිපතිවරුන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කෙරෙහි දක්වන දේශපාලන පක්ෂග්‍රාහීත්වය ප්‍රකට කරුණකි. මෙම තත්වය වහා නිවැරදි කරන ලෙස CMEV පොලිස් කොමිසමෙන් සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් මගින් සහතික කර ඇති සාමකාමීව රැස්වීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කරමින් මහජන විරෝධතා වලට එරෙහිව නීති විරෝධී ලෙස ප්‍රතිචාර දැක් වූ බවට චෝදනා එල්ලවන සියලු නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව CMEV නැවත අවධාරණය කරයි.

නව රජයක් පත්කර ගැනීමට මහජනතාවට අවස්ථාව ලබා දීමෙන් තොරව වත්මන් දේශපාලන අර්බුධය විසඳීමට නොහැකි බව CMEV යේ විශ්වාසයයි. වත්මන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් බහුතරයක් කෙරෙහි ජනතා විශ්වාසය අහිමිවී ඇත. 2023 පෙබරවාරි 20 දින දක්වා පාර්ලිමේන්තුව විසිර වීමට ජනාධිපතිවරයාට ව්‍යවස්ථාපිත බලයක් නොමැති බැවින් විධායක ජනාධිපතිවරයාට එකී බලය ලබා දීමට අවශ්‍ය පාර්ලිමේන්තුව විසුරුවාහරින ලෙස යෝජනාවක් සම්මත කර නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම් වලට ගරුකරන ලෙස සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන්ගෙන් CMEV ය ඉල්ලා සිටී. එමගින් ජනතාවට වර්තමාන අර්බුධයට විසඳුම් සෙවීම සඳහා විශ්වාසය හා ශක්තිය ඇති නියෝජිතයන් තෝරා පත්කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇත.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පී සරවනමුත්තු | ලසන්ත ද සිල්වා | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |